**කෝරලෙයිපත්තු උතුර ප්‍රාදේශීය සභාව - 2021**
---------------------------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කෝරලෙයිපත්තු උතුර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කෝරලෙයිපත්තු උතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු දායක මුදල් රු. 34,773 ක් මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් වශයෙන් දක්වා නොතිබුණි. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු දායක මුදල් රු. 34,773 ක් සම්බන්ධ විස්තර නිෂ්චිතව සනාථ කර ගත නොහැකිවූ බැවින් වගකීමක් වශයෙන් දැක්වූයේ නැත. | වගකීම් නිරවුල් කරගෙන ගිණුම්වල දැක්විය යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. 95,611,060 ක් වූ වත්කම් ශේෂ 05 ක් සම්බන්දයෙන් ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය සහ වත්කම්වල කේවල වටිනාකම් ඉදිරිපත් කර නොතිබුණි. | ඔබ විසින් පෙන්වා දෙන ලද වත්කම්වලට අදාල ලියවිලි ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවති. | වත්කම් සඳහා ලිඛිත සාක්ෂි ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවූ අවස්ථාවන් පහත දැක්වේ.

| නීති, රීති ,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් | වර්ෂ 03 ක කාල පරිච්ඡේදයතුල ලබා දී තිබූ රු. 565,497 ක | පෙන්වා දෙන ලද කරුණු ඉදිරි වර්ෂයේදි | මුදල් රෙගුලාසි අනුව අත්තිකාරම් අයකර |

| | | | |
|---|---|---|---|
| රෙගුලාසි 371(2)(ආ) | අත්තිකාරම් මුදල අදාල කාල පරිච්ඡේදය තුල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගැනීමට කටයුතු කළ යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**

--------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

-----------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,850,993 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,437,231 ක් විය.

**2.2** **ආදායම් පරිපාලන**

--------------------

**2.2.1** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

------------------------------------

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දක්වා ඇත.

| | විගණන නිරීකෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා සතු කඩ කාමර 08 කින් කඩ කාමර 02 ක් බදු දීමට කටයුතු නොකිරීමෙන් ආදායම් අහිමිවී තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා බදු දී තිබූ කඩ කාමරවලින් රු. 363,550 ක හිඟ කුලී මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දැනට එම කඩ කාමර බදු දීමට කටයුතු කර ඇති අතර, හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත. | වත්කම් අදාල අරමුණ සඳහා යොදවා ගැනීමටත් හිඟ මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ යන්ත්‍රසූත්‍ර බදු දීමෙන් රු. 303,350 ක් හිඟව තිබූ අතර, එය අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව විසින් මහජනයා වෙත ජලය බෙදාහැරීම් සඳහාවූ ගාස්තු රු. 713,689 ක හිඟයක් පැවතුනද, එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් වර්ෂයේ රටේ පැවති අසාමාන්‍ය තත්ත්වය හේතුවෙන් හිඟ මුදල් අයකිරීමේ ප්‍රමාදයක් සිදුවී ඇත. දැනට හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇති බව කරුණාවෙන් දන්වා සිටිමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

| | විගණන නිරීකෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2000 ජුලි 13 දින අංක 2184/9 දරණ අති විශේෂ ගැසට්පත්‍රයේ ප්‍රකාශය කල පරිදි දුරකථන | ඉදිරියේදි දුරකථන ගාස්තු ගෙවීමේදි අවධානය යොමු | ගැසට්පත්‍ර දැන්වීම් අනුව බිල්පත් ලබා ගැනීමෙන් |

| | | |
|---|---|---|
| බිල්පත් ඉදිරිපත් නොකර රු. 264,000 ක් සභාපති, උප සභාපති සහ මන්ත්‍රීවරුන් සඳහා දුරකථන ගාස්තු ගෙවා තිබුණි. | කරන බව දන්වා සිටිමි.. | අනතුරුව දුරකථන ගාස්තු ගෙවිය යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ වාහරෙයි, මාංකේනි සහ කදිරවෙලි මහජන පුස්තකාලවල පුස්තකාල පොත් 407 ක අස්ථාන ගතවී ඇති බව අනාවරණය විය. එම පොත් නැවත ලබා ගැනීමට හෝ පොත්වල වටිනාකම අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | පොත් අස්ථාන ගතවීම සම්බන්ධයෙන් අවශ්‍යා කටයුතු කරමින් පවති. | පොත්පත් නැවත ලබා ගැනීමට හෝ පොත්වල වටිනාකම අයකර ගැනීමට හෝ සභාව විසින් කටයුතු කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

---------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු වාහන 07 ක් සහ ට්‍රැක්ටර් ටේලර් 04 ක් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු අළුත්වැඩියා කළයුතු වාහන වත්කම් මූල්‍යා ප්‍රතිපාදන ලැබු විගස අළුත්වැඩියා කිරීමට කටයුතු කරනු ලැබේ. | වාහන අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ පැවති තනතුරු 07 කට අදාල පුරප්පාඩු 12 ක් පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කළ තනතුරු සඳහා සභාවේ අවධානය යොමුකර කටයුතු කරමින් පැවති. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

**4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරණ විගණන පනතේ උප වගන්ති 16(2) අනුව වාර්ෂික කාර්යසාධන ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී මූල්‍යා ප්‍රකාශන සමහ කාර්ය සාධන සැලැස්ම ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ජාතික විගණන පනත අනුව වාර්ෂික කාර්යසාධන සැලැස්ම ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**4.2 විගණන කමිටු**

-----------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර රැස්වීම් පවත්වා නොතිබුණි. | ඉදිරියේදි නිසිපරිදි රැස්වීම් පැවත්වීමට සභාව විසින් කටයුතු කරමින් පවතී. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවත්වීමට කටයුතු කළ යුතුය. |

**4.3 තිරසාර සංවර්ධන ඉලක්ක**

-----------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරණ තිරසාර සංවර්ධන පනත අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකළ යුතු තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබුණි. | සභාවේ මූල්‍ය තත්ත්වය අනුව ඉදිරියේදි මෙම අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |